**ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාව - 2023**

**----------------------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ, 1987 අංක 47 දරන ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභා පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සභාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදල අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සභාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සභාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සභාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 අධිකාරී බලය නොලත් ගනුදෙනු

| අධිකාරී බලය නොලත් ගනුදෙනු පිළිබඳ විස්තරය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ප්‍රතිපත්ති සභාවේ හිටපු සභාපතිවරයාගේ ධූර කාලය 2018 නොවැම්බර් 07 දින අවසන් වී තිබියදී 2018 නොවැම්බර් 07 දින සිට 2018 දෙසැම්බර් 31 දක්වා මාස දෙකකට ආසන්න කාලය සඳහා රු.197,600 ක මුදලක් වැටුප් හා දීමනා ලෙස ගෙවා ඇතත් එම මුදල නැවත අයකර ගැනීමට හෝ ලැබිය යුතු මුදලක් ලෙස ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි. | විගණනය විසින් පෙන්වා දී ඇති පරිදි ගිණුම් කටයුතු සඳහා ඉදිරි උපදෙස් ඉල්ලුම් කරමින් අමාත්‍යාංශය වෙත යොමු කර ඇත. | වැඩිපුර ගෙවීම ගිණුම් ගත කළයුතු අතර ගෙවීම නිර්දේශ කළ, අනුමත කළ සහ ගෙවීම සිදු කළ පාර්ශවයන්ගෙන් අයකර ගත යුතුය. |

## 1.6 ලැබිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| කෘෂිකාර්මික පර්යේෂණ කටයුතු සඳහා, පර්යේෂණ ආයතන 3 කට හා විශ්වවිද්‍යාල 3 කට ලබාදුන් මුදල්වලින්, වියදම් නොකර ඉතිරිව ඇති රු.659,131 ක් සභාව වෙත ගෙන්වා නොගෙන 2006 වර්ෂයේ සිට මූල්‍ය ප්‍රකාශනවල ඉදිරියට ගෙන එමින් තිබුණි. | රුහුණු විශ්වවිද්‍යාලය රු.200,000 ක බිල්පත් සභාවට යොමු කර ඇති බැවින් එම මුදල රු.459,131 ක් දක්වා අඩු වී ඇත. ආයතනය වෙත අයවිය යුතු මුදල සඳහන් කර ලිපි හා සිහිකැඳවීම් ලිපිද අදාළ ආයතන වෙත යොමු කර ඇත. තවද මේ සම්බන්ධයෙන් නිර්දේශ සඳහා විගණන සහ කළමනාකරණ කමිටුව වෙත වාර්තාවක් යොමුකර ඇති අතර එහිදී ලබා දුන් උපදෙස් මත ඉදිරියේදී පාලක මණ්ඩලය වෙත යොමුකර මෙම ශේෂය නිරවුල් කිරීමට ඉදිරියේදී පියවර ගනිමි. | අදාළ හිග මුදල් අයකර භාණ්ඩාගාරයට ප්‍රේෂණය කළ යුතුය. |

**1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| | 1987 අංක 47 දරන ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභා පනතේ | | | |
| (අ) | 10 වගන්තිය | කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සකස් කිරීමත් ඒ හා සම්බන්ධ අනෙකුත් කටයුතු පිළිබඳවත් පර්යේෂණ ආයතන හා ආණ්ඩුව අතර සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීමත් ප්‍රතිපත්ති සභාවේ කර්තව්‍යයක් වන නමුත් පනත ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | 2023 වසරේ සභාවේ කර්තව්‍යයන් වන ආණ්ඩුව හා පර්යේෂණ ආයතන අතර අදහස් හුවමාරු කර ගැනීමේ මාර්ගයක් වශයෙන් වැඩමුළු හා සම්මන්ත්‍රණ පවත්වන ලදී. එහිදී පර්යේෂණ ආයතන හා ප්‍රතිපත්ති සකස්කරන්නන් අතර සම්බන්ධීකරණ කටයුතු සිදුකරන ලදී. තවද, පර්යේෂණ ප්‍රමුඛතා සැකසීමේදී ආණ්ඩුවේ පුද්ගලික පර්යේෂණ ආයතන සම්බන්ධ කරගෙන රජයේ ප්‍රතිපත්ති සකස් කිරීම හා සම්බන්ධවන අදහස් හුවමාරු කිරීම සිදු කරන ලදී. | පනත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | 10 (ඟ) උප වගන්තිය | අන්තර් ආයතනික කෘෂිකාර්මික පර්යේෂණ ව්‍යාපෘති සඳහා කටයුතු සැලසීම හා මුදල් සැපයීම සභාවේ කර්තව්‍යයක් වුවත් සමාලෝචිත වර්ෂයේදී නව ව්‍යාපෘති හඳුනාගෙන ඒ සඳහා මුදල් සපයා නොතිබුණි. | 2023 වසරේදී නව ව්‍යාපෘති 03 ක් සඳහා මුදල් සපයන ලදී. | පනත ප්‍රකාරව නව පර්යේෂණ ව්‍යාපෘති හඳුනාගෙන ඒවා ඉටු කළ යුතුය. |
| (ඇ) | 11 (ඇ) උප වගන්තිය | ප්‍රතිපත්ති සභාව තීරණය කරන සුරැකුම්පත්වල මුදල් ආයෝජනය කිරීමේ බලය සභාව සතු වුවත් 2023 දෙසැම්බර් 31 දිනට සභාව සතු අතිරික්තව පැවති රු.14,786,815 ක් ජංගම ගිණුමක හා රු.16,989,418 ක් ඉතිරි කිරීම යන ගිණුම් දෙකක රඳවාගෙන සිටින බව නිරීක්ෂණය විය. | එකඟ වේ. ඉදිරියේ දී ආයතනයේ පාලක මණ්ඩලයේ අනුමැතිය මත සුරැකුම්පත්වල ආයෝජනය කිරීමට කටයුතු කරමි. | අතිරික්ත මුදල් ආයෝජනය කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ඈ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ අංක 380(2) හා 446 | ප්‍රතිපත්ති සභාව විසින් ලංකා බැංකුවේ නිදහස් චතුරස්‍ර ශාඛාවේ පවත්වාගෙන යන ඉතිරිකිරීමේ ගිණුම් 02 ක් ආරම්භ කිරීමට මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබා ගෙන නොතිබුණි. | මහාභාණ්ඩාගාර අනුමැතියට අදාළ ලේඛන සොයා ගැනීමට අපහසු වූ අතර එම ලේඛන ඉදිරියේදී ඉදිරිපත් කිරීමට හෝ එසේ නොමැති වුවහොත් මහාභාණ්ඩාගාර අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරමි. | මහා භාණ්ඩාගාරයේ අනුමැතිය මත බැංකු ගිණුම් ආරම්භ කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.19,919,221 ක ඌනතාවයක් වූ අතර ඊට ප්‍රතිරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.13,108,799 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.33,028,020 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට භාණ්ඩාගාරයෙන් ලද ප්‍රදාන රු.72,926,081 කින් අඩු වීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කෘෂිකාර්මික පර්යේෂණ කළමනාකරුවන් සඳහා වන තොරතුරු පද්ධතිය(INFORM) සඳහා පර්යේෂණ ආයතන 30 කින් තොරතුරු කැඳවීම සඳහා සැලසුම් කර තිබුණු නමුත් 2023 වර්ෂයේදී තොරතුරු කැඳවා තිබුණේ ආයතන 24 කින් පමණක් වූ අතර පර්යේෂණ පිළිබඳව රැස් කරන ලද තොරතුරු ඇතුළත් කර වාර්ෂිකව නිකුත් කළ යුතු වාර්තා පොත් 2019 වර්ෂයෙන් පසුව නිකුත් කර නොතිබුණි. | 2023 වර්ෂයේ ආයතන 27 කින් මේ වන විට තොරතුරු ලබා ගෙන ඇති අතර, ඉතිරි ආයතන 03 සඳහා තොරතුරු ලබා ගැනීමට සිහි කැඳවීම් යවා ඇත. 2019 වසරට අදාළ පොත 2023 වසරේ නිකුත් කර ඇති අතර, 2020 සහ 2021 වසරට අදාළව දත්ත ඇතුළත් වාර්ථා පොත් මේ වන විට සකසමින් පවතී. | වාර්ෂිකව නිකුත් කළ යුතු වාර්තා පොත් නිකුත් කළ යුතුය. |
| (ආ) | 2017 වර්ෂයේ සිට කොවිඩ් වසංගත තත්ත්වය දක්වා වූ කාලපරිච්ඡේදය තුළ පශ්චාත් උපාධි සඳහා විදේශගත වූ, ජාතික කෘෂි පර්යේෂණ පද්ධතියේ පර්යේෂකයින් 25 දෙනෙකු කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් ප්‍රතිපත්ති සභාවට නොදන්වා මෙරටට පැමිණ සිටි අතර මෙරට සිටි කාලසීමාව සඳහා රු.21,076,932 ක යැපුම් දීමනාව ගෙවීම, 2020 වර්ෂයේ සිට 2022 කාලය තුළදී අයකරගත් රු.11,026,926 ක මුදල මහා භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය නොකිරීම සහ තවදුරටත් අයවිය යුතු රු.8,490,164 ක මුදලක් අයකරනොගෙන පැවතීම යන කරුණු නිරීක්ෂණය විය. | ආයතනය වෙත නොදන්වා මෙරටට පැමිණ සිටි කාලසීමාව සඳහා ගෙවා තිබූ යැපීම් දීමනා (Stipend) 2020 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා අයකර කොටසක් අයකර ඇත.මෙම යැපීම් දීමනා හිලව් කිරීමට අදාළ ප්‍රතිපාදන මහා භාණ්ඩාගාරයෙන් ලබා ගෙන නොමැත. ගෙවීමට නියමිත වූ ශේෂ මුදලට අදාළ ප්‍රතිපාදන පමණක් මහා භාණ්ඩාගාරයෙන් ලබා ගෙන ඇත. | මෙරටට පැමිණි කාලසීමාවට අදාළ යැපුම් දීමනාව අයකර මහා භාණ්ඩාගාරයට ප්‍රේෂණය කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | කෘෂිකර්ම අමාත්‍යාංශයෙහි පවතින පර්යේෂණවල අවසන් වාර්තා සභාව විසින් සමාලෝචනය කළ යුතු වුවත් 2015 සිට 2020 දක්වා කාලයට අදාළව නිම කිරීමට නියමිතව පැවති පර්යේෂණ 3 ක අවසන් වාර්තා කාලීනව ලබා ගෙන සමාලෝචනය කර නොතිබුණි. | කෘෂිකාර්මික පර්යේෂණ ව්‍යාපෘති සඳහා අරමුදල් සපයන ජාතික කෘෂිකාර්මික පර්යේෂණ සැලැස්ම (NARP) ව්‍යාපෘතියේ 2015 සිට 2020 දක්වා කාලයට අදාලව අවසන් පර්යේෂණ වාර්තා 04 න් දිගින් දිගටම සිදු කරන ලද සිහිකැඳවීම් හමුවේ එක් අවසන් වාර්තාවක් 2023 ජූලි 05 වන දින ලැබුණු අතර, මේ වන විට අවසන් වාර්තා 03 ක් ලැබීමට ඇත. | පර්යේෂණවලට අදාළ අවසන් වාර්තා කාලීනව ලබා ගෙන සමාලෝචනය කළ යුතුය |
| (ඈ) | ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාව මඟින් පසුගිය වර්ෂයේදී පැවැත්වීමට සැලසුම් කර තිබුණු ජාතික සම්මාන උළෙල (SLCARP National Awards) සඳහා අයදුම්පත් කැඳවා, ඇගයීම් කමිටු පත්කර, ඇගයීම් කටයුතු අවසන් කර තිබුණද සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් එම සම්මාන උළෙල පවත්වා නොතිබුණි. | සභාව 2021 වසරේ දී පැවැත්වීමට සැලසුම් කර තිබුණු ජාතික සම්මාන උළෙල සඳහා අයදුම්පත් කැඳවා ඇගයීම් කටයුතු අවසන් කර තිබුණ ද භාණ්ඩාගාරයෙන් ප්‍රාග්ධන අරමුදල් ලබා දීම 2023 වර්ෂයේ 3 වන කාර්තුවේ සිදුවීම හා එම කාලය තුළ කෘෂිකර්ම අමාත්‍යවරයා කාර්යබහුල වීම මත දින වෙන්කරවා ගැනීමට අපහසු වීම හේතුවෙන් මෙම උළෙල සැලසුම් කළ පරිදි පැවැත්වීමට නොහැකි විය. | සම්මාන උළෙල සැලසුම් ප්‍රකාරව පැවැත්වීමට කටයුතු කළ යුතුය |
| (ඉ) | ජාතික කෘෂිකාර්මික පර්යේෂණ සැලැස්ම(NARP-NUS) යටතේ අරමුදල් සපයන අනුරාධපුරය සහ පොළොන්නරුව දිස්ත්‍රික්ක වල මතුපිට පස්වල ඇතිවියහැකි විෂ සහිත අංශු එහි සාන්ද්‍රණය සහ ව්‍යාප්තිය වී වගාව සම්බන්ධව ''PHYTO'' සාන්ද්‍රණය කොපමණද යන්න පිළිබඳ පරීක්ෂාව සඳහා වූ “Status of Potentially toxic trace elements in surface soils in Anuradhapura and Polonnaruwa districts: Baseline concentrations, spatial distribution and phyto availability for rice” ව්‍යාපෘතිය පරීක්ෂාවේදී නිරීක්ෂණය වූ කරුණු පහත පරිදි විය.<br>(i) කෘෂිකර්ම අමාත්‍යාංශය, ප්‍රතිපත්ති සභාව හා පේරාදෙණිය විශ්වවිද්‍යාලය අතර 2019 වර්ෂයේදී මෙම ව්‍යාපෘතිය සඳහා ගිවිසුම්ගත වී තිබුණි. ගිවිසුම අත්සන් කර වර්ෂ 03 ක කාලයකට හෝ අන්‍යෝන්‍ය එකඟතාවයෙන් ව්‍යාපෘති කාලය දීර්ඝ කරගත හැකි වුවත් සභාව විසින් වර්ෂ 5 ක් පුරා ගෙවීම් සිදුකරමින් ව්‍යාපෘති කාලය දීර්ඝ කරගෙන නොතිබුණි. | 2019 වසරේදී පේරාදෙණිය විශ්ව විද්‍යාලය සමඟ එම ව්‍යාපෘතිය සඳහා ගිවිසුම්ගත වී තිබූ නමුත් 2020 සහ 2021 වසර වල පැවති කොවිඩ් වසංගත තත්ත්වය සහ මූල්‍ය අර්බුදය හේතුවෙන් මෙම ව්‍යාපෘතිය ඉතා අපහසුතාවයකින් පවත්වාගෙන ගිය අතර, මෙම ව්‍යාපෘතිය සඳහා 2021 සහ 2022 වර්ෂයන්හි අරමුදල් ලබා දෙනු ලැබුවේ වසර අගභාගයේදී ය. එම හේතූන් නිසා මෙම ව්‍යාපෘතිය සඳහා වසර 04 ක් පුරා අරමුදල් ලබා දීමට සිදු විය. මේ හේතූන් නිසා 2021, 2022 සහ 2023 වර්ෂයන්හි අරමුදල් සැපයීමට ලේකම්තුමාගේ අනුමැතිය හිමි වී ඇත. 2023 වර්ෂයේ සපයා ඇති රු.240,000.00 ක අරමුදල සපයා ඇත්තේ 2022 වර්ෂයට අදාළ පර්යේෂණ සහකාර දීමනා ගෙවීම සඳහාය. ඒ අනුව මෙම ව්‍යාපෘතිය වසර 04 ක් දක්වා පවත්වාගෙන ගොස් ඇත. | අරමුණුගතව ව්‍යාපෘති කාලය දීර්ඝ කර ගත යුතුය. |

| | | |
|---|---|---|
| (ii) 2021 වර්ෂය තුළ අවස්ථා 2 කදී ලබා දී තිබුණු එකතුව රු.5,760,000 ක් වූ මුදලින් රු.4,587,190 ක මුදලක් ව්‍යාපෘතිය කාර්ය සඳහා ප්‍රයෝජනයට නොගෙන මාස 5 ක කාලයක් නිශ්කාර්යව පැවතුණු බව නිරීක්ෂණය විය. | ව්‍යාපෘතියට අදාළ උපකරණ ලබා ගැනීමට අවශ්‍ය මුදල් අදාළ විශ්වවිද්‍යාලය වෙත වසර මැද භාගයේ සපයා ඇත. ප්‍රසම්පාදන කාර්යයට අදාළ කටයුතු ආරම්භ කර ඇත්තේ අරමුදල් විශ්වවිද්‍යාලයට ලබා දීමෙන් පසුවය. ප්‍රසම්පාදන ක්‍රියාවලිය සඳහා ගත වූ කාලය මාස 05 කට වඩා වැඩි විය. එබැවින් 2021 වසරේ අදාළ උපකරණය මිලදී ගැනීමට නොහැකි වූ අතර, එම අරමුදල් නැවත 2021 දෙසැම්බර් 31 ට පෙර අමාත්‍යාංශය වෙත යැවීමට සිදුවිය. අදාළ ප්‍රසම්පාදන කටයුතු සිදු කර 2022 වසරේ අරමුදල් ලබාදුන් පසු අදාළ උපකරණ මිලදී ගෙන ඇත. | ව්‍යාපෘති කාලය සහ මුදල් නිසියාකාරව කලමනාකරණය කර ගැනීමට කටයුතු කළ යුතුය. |

**3.2 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රතිපත්ති සභාව පිහිටි ගොඩනැගිල්ලට කොටසක් එකතු කරගැනීම සඳහා වූ කොන්ත්‍රාත්තුව 2019 වර්ෂයේදී රු.12,300,000 ක ගොඩනැගිලි දෙපාර්තමේන්තුව සමග ඇතිකරගත් අවබෝධතා ගිවිසුමේ කොන්දේසි ප්‍රකාරව පවරා ඇතත් වැඩ නිම කළ යුතු දිනය වූ 2020 අප්‍රේල් 30 දිනට වැඩ අවසන් කර නොතිබුණි. 2022 ඔක්තෝබර් 10 දින වන විට සහතික කළ වැඩවල වටිනාකම රු.5,516,590 ක් වුවත් ඔවුන් වෙත රු.12,217,303 ක මුදලක් ගෙවා තිබුණු හෙයින් සහතික නොකළ වැඩ සඳහා රු.6,700,713 ක් වැඩිපුර ගෙවා තිබුණද සැලසුමට අනුව මෙම ව්‍යාපෘතිය නිමකරවා ගැනීමට නම් රු.11,088,000 ක මුදලක් අමතරව දැරිය යුතු බව මෑතකදී සිදුකළ ඉංජිනේරු ඇස්තමේන්තුවක් මගින් ඉදිරිපත් කර තිබූ අතර එසේ නොවුනහොත් මෙතෙක් වැය කළ මුදලින් ද අදාළ ප්‍රයෝජනය ගත නොහැකි වී ඇති බව නිරීක්ෂණය විය | මෙම ගොඩනැගිල්ල ඉදිකිරීම් සඳහා 2019 වර්ෂයේ ගොඩනැගිලි දෙපාර්තමේන්තුව සමඟ ගිවිසගත් නමුත් 2020 වර්ෂයේ සහ 2021 වර්ෂයේ දී සභාවට මුදල් නොලැබීම මෙන්ම Covid 19 වසංගතය සහ රටේ පැවති දැඩි ආර්ථික අර්බුදය හේතුවෙන් ද මෙම ඉදිකිරීම් කටයුතු නියමිත කාලයට අවසන් කිරීමට නොහැකි විය. ගොඩනැගිල්ලේ ඉතිරි වැඩ නිම කිරීම සඳහා රු.11,088,000 ක ඇස්තමේන්තුවක් ගොඩනැගිලි දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කර ඇත. ගොඩනැගිල්ලේ වැඩ නිමකර නොමැති වීම හේතුවෙන් වායුසමීකරණ යන්ත්‍ර සවිකර නොමැති වුවද නව ජල ටැංකිය හරහා ආයතනයට ජල සැපයුම ලබාදී ඇත. | ගොඩනැගිල්ලේ වැඩ නිමකර ගැනීමට කටයුතු කළ යුතුය. |

**3.3 වාහන පද්ධතිය කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාව නමින් පවත්වාගෙන ගිය විදේශීය අරමුදල් මත ක්‍රියාත්මක වූ ව්‍යාපෘතියේ නමින් ලියාපදිංචි කළ Hillux ඩබල් කැබ් රථය ව්‍යාපෘතිය නිම කිරීමෙන් පසුව ප්‍රතිපත්ති සභාවට පවරාගෙන නොතිබුණු නිසා වසර 20 ක් පුරා එම වාහනය අයථා පරිහරණයට ලක්ව ඇත. | මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් වෙතින් JW 3904 දරණ කැබ් රථයේ අයිතිය සනාථ කර ගැනීම සඳහා වාර්තාවක් ලබාගත් අතර එම වාර්තාව අනුව එම වාහනයේ වර්ථමාන හිමිකරු ලෙස M/S ICRAF (World Agro Forest Centre) Sri Lanka ලෙස දක්වා ඇති අතර වර්තමාන හිමිකරු ලෙස CARP-Tree Domestication Project, 114/9, Wijerama Mawatha, Colombo 07 ලෙස දක්වා ඇත. එබැවින්, JW 3904 දරන මෙම වාහනය සභාවට පවරා ගැනීමේ නීත්‍යානුකූල හැකියාව පිළිබඳව පැහැදිලි කර ගැනීම සඳහා නීතිපති දෙපාර්තමේන්තුව වෙත මෙම ව්‍යාපෘතියට අදාළ ගිවිසුමේ පිටපතක් ද ඇමුණුමක් සහිතව යොමුකර ඇත. තවද, මහාචාර්ය ඩී.කේ.එන්.ජී පුෂ්පකුමාර මහතා විසින් 2023.08.23 දිනැතිව සභාවට යොමු කර ඇති ලිපිය මඟින් ප්‍රකාශ කරනු ලබන්නේ මෙම කැබ් රථය 2023.08.03 වන දී ICRAF ආයතනය හා වාරිමාර්ග හා පරිසර, වන සම්පත් වැවිලි බෝග හා කෘෂිකර්ම අමාත්‍යාංශය එක්ව ක්‍රියාත්මක කරන ව්‍යාපෘතියක් සඳහා භාර දී ඇති බවය. | වාහනය සභාව වෙත පවරා ගත යුතුය. |